# කොළඹ විශ්වවිද්‍යාලය
# නීති පීඨය

## නීතිවේදී උපාධි පරීක්ෂණය, තෙවන වසර - 2019

## අන්තර්ජාතික ආයෝජන නීතිය

(පැ. තුනයි)

මුළු ප්‍රශ්න සංඛ්‍යාව: 07

එක් කොටසකින් ප්‍රශ්න දෙක (02) බැගින් තෝරා ගෙන ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න.

(අපැහැදිලි අත් අකුරු වලට ලකුණු අඩුකරනු ලැබේ.)

---

**A - කොටස**

රේඩියන්ට් රිසෝසස් කෝපරේෂන් (RRC) ඛනිජ ද්‍රව්‍යය ආශ්‍රිතව ගනුදෙනු කිරීමේ පරමාර්ථය ඇතිව ලිවීඩියානු නීතිය යටතේ නිසි පරිදි සංස්ථාපනය කර ඇත. නොලීවියානු දේශසීමාවේ කිලෝමීටර් හැත්තෑවක් (70) ඇතුලත පිහිටා ඇති ආග්‍රාරියාවේ හැපි පළාතේ රන් ආකර පවතී. ආග්‍රාරියානු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 75 වන ව්‍යවස්ථාව විදේශිකයන් කිසිදු ස්වභාවික සම්පතක් අත්පත් කරගැනීම හෝ භුක්ති විඳීම වලක්වාලනු අතර එවැනි අත්පත් කරගත් අයිතිවාසිකම් රජය වෙත නැවත පැවරීමේ දණ්ඩණයට යටත්වේ. කෙසේ වෙතත්, 75 වන ව්‍යවස්ථාවේ අතුරු විධානය පරිදි විදේශිකයෙකුට දේශසීමා කලාපයේ ස්වභාවික සම්පත් ආශ්‍රිතව අයිතිවාසිකම් ලබාගැනීමට “මහජන අවශ්‍යතාවක්” ඇතැයි ඔහු හෝ ඇය සාර්ථකව පෙන්වා දෙන්නේ නම් නීතියට අනුකූලව එහිලා කැබිනට් තීරණයකින් විශේෂයෙන් අනුමැතිය ලබාගනී නම් ඊට අවසර ඇත.

2015 වසරේදී, RRC සිය සේවකයකු වන ආග්‍රාරියානු ජාතික වැලන්ටයින් මහතා සමඟ, සමාගම "මහජන අවශ්‍යතාවක්" පිළිබඳව පදනමක් සකසාගන්නා අතරතුර, ඔහු රන් ආකර ආශ්‍රිත ඛනිජ අයිතිවාසිකම් ලබාගන්නා ලෙසට එකඟත්වයකට එළැඹිණ. “විකල්ප එකඟතාව” (Option Agreement) ලෙස හැඳින්වෙන මෙම එකඟතාවය තවදුරටත් ප්‍රකාශ කළේ වැලන්ටයින් මහතා සියලු අවශ්‍ය අවසරයන් සාර්ථකව ලබාගතහොත් කැනීම් අනුමත කිරීම් (mining concessions) ඔහුගෙන් අත්පත් කරගැනීමට RRC වෙත විකල්පය පවතින බවයි. වැලන්ටයින්

මහතා මෙම "විකල්ප එකඟතාව" 2017 සැප්තැම්බර් 5 වන දින ආග්‍රාරියානු ජාතික මහජන ලේඛනයන්හි ලියාපදිංචි කළේය.

මේ අතරතුර, ආග්‍රාරියානු පුරවැසියෙකු ලෙස වැලන්ටයින් මහතා සිය පුද්ගලික මට්ටමින් අදාල කැණීම් අවසරයන් සඳහා ඉදිරිපත් කළ අයදුම්පත්‍ර සාර්ථක විය. 2017 ජූනි මස බලයලත් ආග්‍රාරියානු අධිකාරිය ඔහු වෙත අවසරයන් පහක් ප්‍රදානය කරමින් සම්මතයන් නිකුත් කළේය. 2017 ජූලි මස, RRC රන් ආකර මහජන අවශ්‍යතාවක් ලෙස ප්‍රකාශ කරවා ගැනීමේ කාර්යපටිපාටිය ආරම්භ කළ අතර, එය 2017 නොවැම්බර් මස 03 දින ආග්‍රාරියානු කැබිනට් මණ්ඩලය අනුමත කළේය. එමඟින් අදාල කැනම් අවසරයන් අත්පත් කරගැනීමට, හිමිකර ගැනීමට සහ ක්‍රියාත්මක කිරීමට මෙන්ම හිමිකාරීත්වය මත ජනිත වන සියලු අයිතිවාසිකම් ක්‍රියාවට නැංවීමට RRC හට අවසර ලැබිණ.

ඉන් පසුව, RRC, විකල්ප එකගතාවෙහි වන කැනීම් අයිතිවාසිකම් පවරා ගැනීම් සඳහා වන සිය විකල්පය බලාත්මක කළේය. RRC හැපි රන් ආකර ව්‍යාපෘතිය ආරම්භ කොට ඇමරිකානු ඩොලර් මිලියන විස්සකට ආසන්න ක්‍රියාකාරකම් විශාල ප්‍රමාණයක් එම ප්‍රදේශය තුළ සිදු කළේය. කෙසේවෙතත්, යාබද ජන සමූහයන් අසතුටු වූ අතර හැපි රන් ආකර ව්‍යාපෘතියට එරෙහිව විරෝධතා ආරම්භ කළේය. ව්‍යාපෘතියේ ප්‍රතිලාභයෙන් කොටසක් ඉල්ලා සිටි විවිධ ජන සමූහ, RRC හි කාර්ය මණ්ඩලයට තර්ජනය කිරීම්, කායික රඳවා ගැනීම් සහ පහර දීම් සිදු කළේය. තවත් සමහර ජන සමූහ RRC හි අංගනයට කඩාවැදී එය මංකොල්ලකා සමාගමේ කාර්යාලයට ගිනි තැබූහ. RRC මෙම සියලුම සිදුවීම් පොලිසිය වෙත වාර්තා කළේය.

2019 ජනවාරි මස, මිල අධික ගවේෂණයන්හි සහ සංවර්ධන ප්‍රයත්නයන්හි නිරත වීමෙන් RRC, රත්‍රං අවුන්ස මිලියන 95.5 ක සම්පත් පෙන්වා දෙමින්, මූලික ආර්ථික තක්සේරුවේ ප්‍රතිඵල ප්‍රකාශයට පත් කළේය. යම් ප්‍රතිලාභ ලබා දෙන බවට පොරොන්දු වෙමින් සමහර ජන සමූහයන්හි සහයෝගය ලබා ගැනීමටද RRC ට හැකි විය. කෙසේවෙතත්, RRC හි ප්‍රජාව වෙත ප්‍රවේශවීමේ (community outreach) ව්‍යාපෘතීන් සාර්ථක නොවීය. පරිසර අමාත්‍යාංශය විසින් සිදු කළ පාරිසරික හා සමාජීය බලපෑම් තක්සේරුව (ESIA) ආශ්‍රිත මහජන සවන්දීම අතරතුර, සහභාගීවූවන් ව්‍යාපෘතිය මුළුමනින්ම අවලංගු කරන ලෙස පැවසීය. මෙම ව්‍යාපෘතියට එරෙහි විරෝධතා ක්‍රම ක්‍රමයෙන් හැපි පළාතේ ඇති සියලු කැනීම් ව්‍යාපෘති වලට එරෙහි දැවැන්ත මහජන විරෝධයක් බවට පත් විය.

RRC විමසීමකින් තොරව, ආග්‍රාරියානු කැබිනට් මණ්ඩලය හැපි රන් ආකර ව්‍යාපෘතිය මහජන අවශ්‍යතාවක් ලෙස ප්‍රකාශ කළ සිය නියෝගය අවලංගු කළේය. මෙම ක්‍රියාමාර්ග මඟින් හැපි පළාතේ ක්‍රියාත්මක වන වෙනත් කිසිදු කැනීම් අවසරයන් කෙරෙහි බලපෑමක් සිදු නොවීය. ආග්‍රාරියානු ජාතිකයෙකු හරහා RRC

විසින් සිදුකරනු ලැබූ ඛනිජ අයිතිවාසිකම් අත්පත් කර ගැනීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 75 වන ව්‍යවස්ථාව උල්ලංඝණය කිරීමක් බව ආග්‍රාරියානු ආණ්ඩුව තවදුරටත් චෝදනා කර සිටියේය.

2001දී, ආග්‍රාරියාව හා ලිවීඩියාව අතර ඇතිවූ ද්විපාර්ශවීය ආයෝජන සම්මුතියේ (BIT) අන්තර්ගත ICSID බේරුම්කරණයෙහි පිහිට පැතීමට අවසර ලබාදෙන ආරවුල් නිරාකරණ වගන්තිය මත පදනම්ව ආග්‍රාරියාවට එරෙහිව අන්තර්ජාතික බේරුම්කරණයක් ආරම්භ කිරීමට RRC පසුව තීරණය කළේය. ලිවීඩියාව සහ ආග්‍රාරියාව යන දෙරටම කිසිදු සීමා කිරීමකින් තොරව ICSID සම්මුතිය අපරානුමත කර ඇත. 2001 ආග්‍රාරියා-ලිවීඩියා ද්විපාර්ශවීය ආයෝජන සම්මුතිය ආවරිත (covered) ලිවීඩියානු අයෝජකයින් වෙත සහ ඔවුන්ගේ ආයෝජනයන්ට සියලු මූලික ආයෝජන සම්මුති ආරක්ෂණයන් ප්‍රදානය කරන බවත් සහ එම මූලික ආයෝජන ආරක්ෂණ සියල්ල ස්වායත්ත (autonomous) ගිවිසුම් සම්මතයන් ලෙස කෙටුම්පත් කොට ඇති බවටත් RRC තවදුරටත් වටහා ගත්තේය. මෙම ද්විපාර්ශවීය ආයෝජන සම්මුතියෙන් ආවරණය වූ ආයෝජනයන් පුළුල් ලෙස අර්ථකථනය කර ඇත්තේ "එක් පාර්ශවයක දේශසීමාව තුළ එම දේශයේ ආර්ථික කටයුතු උදෙසා වන ප්‍රාග්ධන හෝ වෙනත් සම්පත් කැපකිරීමකින් හටගන්නා අයිතිවාසිකමක්ද ඇතුළුව ඕනෑම ආකාරයක වත්කමක්" ලෙසයි. කෙසේවෙතත්, ආයෝජන ආශ්‍රිත නිර්වචනය, ආයෝජනයන් සත්කාරක රාජ්‍යයේ ගෘහස්ථ නීතියට අනුකූලව සිදු කළ යුතු බවට වන අවශ්‍යතාව ප්‍රකාශිතව දක්වයි.

1. ආග්‍රාරියානු රජයේ නීති උපදේශකයා ලෙස, 2001 ආග්‍රාරියා-ලිවීඩියා ද්විපාර්ශවීය ආයෝජන සම්මුතිය යටතේ මෙන්ම ICSID සම්මුතිය යටතේ, රට තුළ RRC හි ආර්ථික කටයුතු ආයෝජනයක්ද යන කාරණය ආමන්ත්‍රණය කරමින් නෛතික උපදේශයක් සකස් කරන්න.

2. ICSID බේරුම්කරණ පර්ෂදය ඉදිරියේ RRC වෙනුවෙන් පෙනීසිටීමට එමඟින් ඔබව නිරත කරවාගෙන ඇත. 2001 ආග්‍රාරියා-ලිවීඩියා ද්විපාර්ශවීය ආයෝජන සම්මුතිය මත පදනම්ව සත්කාරක රාජ්‍යයට එරෙහි ප්‍රබලම චෝදනා ත්‍රිත්වය පිලිබඳව නෛතික මතයක් සකස් කරන්න.

3. 2001 ආග්‍රාරියා-ලිවීඩියා ද්විපාර්ශවීය ආයෝජන සම්මුතියේ වන පොදු ව්‍යතිරේකී ප්‍රතිපාදනය මත පදනම්ව, යම් සම්මුති උල්ලංඝණයක් වේ නම් එහිලා නිදහසට කරුණු ඉදිරිපත් කිරීම සඳහා ආග්‍රාරියානු රජය ඔබෙන් උපදෙස් ඉල්ලා සිටින්නේයැයි උපකල්පනය කරන්න. මෙම පොදු ව්‍යතිරේකී ප්‍රතිපාදනය බදු සහ වෙළඳාම පිළිබඳ පොදු එකඟතාවයේ (GATT) XX ව්‍යවස්ථාව මත පදනම්ව අවශ්‍ය පරිදි සකස් කරනලද (tailor-made), අනෙකුත් කාරණා අතර, මහජන ආරක්ෂාව, පරිසරය හා ක්ෂය වියහැකි ස්වාභාවික

සම්පත් ආරක්ෂාව සඳහා අත්‍යවශ්‍ය පියවර ගැනීමට සත්කාරක රාජ්‍යයට අවසර දෙන ප්‍රතිපාදනයක් ලෙස උපකල්පනය කරමින් නෛතික ලියවිල්ලක් සකස් කරන්න.

## B - කොටස

4. ආර්ථික සංවර්ධනය සහ පරිසර ආරක්ෂාව ආශ්‍රිතව, ද්විපාර්ශවීය ආයෝජන සම්මුතීන්හි පවතින ආරක්ෂණ ප්‍රතිපාදනයන් ආයෝජකයන් වෙත වාසි සලසන්නේද නැතහොත් ආයෝජකයන්ගේ සහ සත්කාරක රාජ්‍යයන්ගේ අභිලාෂයන් අතර ප්‍රමාණවත් තුලනයක් ඇතිකරන්නේද යන්න පිළිබඳව අදහස් දක්වන්න.

5. විදේශ ආයෝජකයන්ගේ ප්‍රවේශය සම්බන්ධයෙන් සත්කාරක රාජ්‍යයට අසීමිත පාලනයක් ඇතිබව රාජ්‍ය පරමාධිපත්‍ය තහවුරු කරයි. කෙසේ වෙතත්, සම්මුති ප්‍රතිපාදන හරහා එකඟ වී ඇති සමහර පූර්ව-ස්ථාපිත අයිතිවාසිකම් මෙම පාලනය කෙරෙහි බලපෑම් කළ හැකිය. මෙය සිදුකළ හැක්කේ කෙසේද යන්න විස්තර කරන්න.

6. අන්තර්ජාතික වෙළඳාමේ හා ආයෝජනයන්හි ගතිකතාවන් (dynamics) කෙසේද යත් මෙම වෙනස්වීම් සමඟ අනුගත වීම සඳහා නියාමනය අවශ්‍යතාවක් කරමින් ඒවායේ ක්‍රියාකාරීන්ගේ භූමිකාව සහ බලපෑම වෙනස් වෙමින් පවතී.

ඔබ එකඟ වන්නේද? ගෝලීය භූමිය (arena) තුළ ආයොජන ක්ෂේත්‍රයෙහි සිටින ක්‍රියාකාරීන් ඇසුරින් ඉහත ප්‍රකාශය විවේචනාත්මකව සාකච්ඡා කරන්න.

7. තමා විසින් ගනු ලබන විවිධ උපායන් හරහා මව් රාජ්‍යයන් ආයෝජන ක්‍රියාකාරකම් කෙරෙහි බලපෑම් සිදුකරන්නේ කෙසේද යන්නත් සහ සත්කාරක රාජ්‍ය සතු ආයෝජන නියාමනය කිරීමේ අයිතියට ඒවා කුමන බලපෑමක් ඇති කරන්නේද යන්නත් සුදුසු නිදසුන් ඇසුරින් විශ්ලේෂණය කරන්න.

****